**01-04-2026** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, පියාව නියමාකාරයෙන්, ඔහු කවුද, කුමක්ද කියා හැඳිනගැනීමේදී ඔය දරුවන්ද අංකානුරූපයි. සෑම කෙනෙක්ම ඔහුව හැඳිනගන්නේ නම්, මෙහි විශාල සෙනගක් සිටිවි.

**ප්‍රශ්නය:** හෙළිදරව්වේ හඬ, සෑම තැනකම පැතිර යන්නේ කවදාද?

**පිළිතුර:** මෙම පැරණි ලෝකය විනාශ කිරීමෙන්, නව ලෝකයේ ස්ථාපනය සිදුකිරීමට, පරමාත්ම දෙවියන්ම පැමිණ ඇති බව, මනුෂ්‍යයන් සොයා ගත් විට. සෑම කෙනෙකුටම විමුක්තිය පිරිණමන පියා, අපගේ භක්තියේ ඵලය අපට ලබා දීමට පැමිණ ඇත. මෙම විශ්වාසය ඇති වන විට, හෙළිදරව්ව සිදුවී, සෑම තැනකම කැලඹීම් ඇති වෙයි.

**ගීතය:** දැනුමේ වර්ෂාව ඇත්තේ ආදරවන්තයා සමඟ සිටින අයටයි.

ඕම් ශාන්ති. ඔය දරුවන්ට ගීතයේ පද පේළි දෙකක් ඇසුණා. වර්ෂාව තිබෙන්නේ ආදරවන්තයා සමඟ සිටින අයටයි. ආදරවන්තයා කවරෙක්ද කියා ලෝකයා නොදනී. බොහෝ දරුවන් සිටින නමුත්, ඔවුන් පියා සිහි කළ යුත්තේ කෙසේද කියා ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් නොදනී. ඔහු සිහිපත් කරන්නේ කෙසේද කියා ඔවුන් නොදනී ඔවුන්ට නැවත නැවතත් ඔහුව අමතක වෙයි. පියා විස්තර කරන්නේ දරුවනි, තමන් ජීවාත්ම බව සලකන්න. ඔබ නිත්‍ය. පියා දැනුමේ මහා සයුර වන අතර, ඔබ ඔහු සිහි කළ යුතුයි. එම සිහිපත් කිරීම නිරන්තර වන ආකාරයෙන්, සිහි කිරීමේ පුහුණුවක් ඇති කරගන්න. අවසානයේදී ඔබට සිහිවිය යුත්තේ මම ජීවාත්මයකි. ඔබ සෑම කෙනෙකුටම ශරීරයක් තිබේ, නමුත් ජීවයක් වීමේ දැනුම ඔබගේ බුද්ධියේ තබාගන්න. ඔබට පියාගේ උපදේශය ලැබී තිබේ. මගේ නියම ස්වරූපයෙන් මාව සිහි කරන්නේ ඉතාමත් දුලබ ටික දෙනෙක් පමණයි. දරුවන් බොහෝ ශරීර අවධානයට පත් වනවා. ඔබ පියාගේ හැඳින්වීම කෙනෙකුට ලබා දෙන තුරු ඔහුට හෝ ඇයට කිසි දෙයක් වටහා ගැනීමට නොහැකි වනු ඇති බව, පියා විස්තර කර ඇත. පළමුවෙන්ම ඔවුන් දැන ගත යුත්තේ, අශාරීරික කෙනා අපගේ පියා, ගීතාවේ දෙවියන් බවත්, සියල්ලන්ටම විමුක්තිය පිරිණමන්නේ ඔහු බවත්ය. මෙකල ඔහු විමුක්තිය පිරිනැමීමේ චරිත කොටස රඟපාමින් සිටිනවා. මෙම කරුණ සම්බන්ධයෙන් ඔවුන්ගේ බුද්ධිය තුළ විශ්වාසය තිබුණේ නම්, සියලුම සාදු සන්‍යාසීන් තත්පරයකදී මෙහි පැමිණෙනු ඇත භාරතයේ මහා කැලඹීමක් ඇතිවෙයි. මෙම ලෝකය දැන් විනාශ වීමට යන බවත්, ඔවුන්ට මේ ගැන විශ්වාසයක්ද තිබුණේ නම්, බොම්බායේ සිට අබූ දක්වා පෝලිමක් තිබෙයි. කෙසේවෙතත්, එතරම් විගසින් කිසි කෙනෙකුට එම විශ්වාසය තිබිය නොහැක. විනාශය සිදු විය යුතු බව, ඔබ දන්නවා. ඔවුන් සියලු දෙනාම ගැඹුරු නින්දක පසුවෙයි. පසුව අවසානයේදී ඔබගේ ආනුභාවය පැතිරෙයි. ගීතාවේ දෙවියන් වන්නේ, උත්තරීතර පියා, උත්තරීතර ජීවාත්මය ශිවා යන කරුණ ගැන විශ්වාසය තිබීම, ඔබගේ නැන්දම්මාගේ ගෙදර යනවා මෙන් නොවෙයි! මෙය ප්‍රසිද්ධ වූයේ නම්, මුළු භාරතය පුරාම එම හඬ පැතිර යාවි. මේ වන විට, ඔබ යමෙකුට විස්තර කරන විට, ඔබ ඔහුට විජ්ජාවක් කර ඇති බව, තවත් කෙනෙක් කියයි. මෙම වෘක්ෂය ඉතා සෙමින් වර්ධනය විය යුතුයි. තවමත් ටික කාලයක් ඉතිරිව තිබේ. ඔබ තවමත් උත්සාහ දැරිය යුතුයි. ඔබ වැදගත් මිනිසුන්ට විස්තර කරන නමුත් ඔවුන්ට කිසි දෙයක් වැටහෙන්නේ නැත. ඔය දරුවන් අතරින්ද සමහරෙකුට මෙම දැනුම වැටහෙන්නේ නැත. පියාගේ සිහි කිරීම නොමැති නම්, එම ස්ථිතිය තිබිය නොහැක. ඔබගේ විශ්වාසය කෙබඳුද කියා පියාට වැටහෙනවා! දැනට, ඔබගෙන් ඇතමුන් පියාව 1% හෝ 2%ක් වත් සිහිපත් කරන්නෙත් කලාතුරකිනි. ඔවුන් මෙතැන අසුන් ගෙන සිටින නමුත්, පියා කෙරෙහි ඔවුන් තුළ එම සෙනෙහස නැත. මෙහි සෙනෙහස සහ භාග්‍යය තිබිය යුතුයි. ඔවුන්ට පියා කෙරෙහි සෙනෙහස තිබුණේ නම්, සෑම පියවරකදීම ශ්‍රීමත් අනුගමනය කළ යුතු බව, ඔවුන්ට වැටහෙයි. අපි ලෝකයේ පාලකයන් බවට පත් වනවා. චක්‍රයෙන් භාගයක ශරීර අවධානය තවමත් තිබෙයි, මේ නිසයි දැන් ජීවාත්ම අවධානයට පත් වීමට බොහෝ උත්සාහයක් දැරීමට සිදුවන්නේ. තමන් ජීවයක් බව සලකා, බොහෝ සෙයින් ආදරණීය පියාව සිහි කිරීම, ඔබගේ නැන්දම්මාගේ ගෙදර යනවා වගේ නොවෙයි! ඔවුන් මෙය කළේ නම්, ඔවුන්ගේ මුහුණු වල එම දීප්තිය තිබෙයි. ගැහැණු ළමයෙක් විවාහ වී, ආභරණ පැළඳූ විට, ඇගේ මුහුණේ බොහෝ සෙයින් සතුට තිබෙයි. කෙසේවෙතත්, මෙහි ඇතැම් අය මනමාලයාව සිහිපත් නොකරයි, එබැවින් ඔවුන්ගේ මුහුණු මැලවී තිබෙයි, ඒ ගැන අහන්නවත් එපා! ගැහැණු ළමයෙක් විවාහ වන විට ඇගේ මුහුණ

බොහෝ සතුටු වන අතර සමහර ගැහැණු ළමයින්ගේ මුහුණු, විවාහ වීමෙන් පසුවත් මළ මිණියක් මෙන් තිබෙයි. නොයෙක් මාදිලියේ අය සිටියි! ඇතැම් අය අනෙක් නිවසට ගිය විට, අවුලට පත් වෙයි. මෙහිද එය එසේමයි. පියා සිහි කිරීමට උත්සාහය අවශ්‍යයි. අවසාන මොහොත ගැන මෙසේ සිහි කර තිබේ 'අතීන්ද්‍රීය සුඛය ගැන, ගොපළු ගොපළියන් ගෙන් විමසන්න.' තමන් ගොපළු ගොපළියන් බව සැලකීමේ සහ පියාගේ නිරන්තර සිහිපත් කිරීමේ ස්ථීතිය ඔබ නිර්මාණය කළ යුතුයි. සැම කෙනෙකුටම පියාගේ හැඳින්වීම ලබා දෙන්න. පියා පැමිණ ඔබට එම උරුමය ලබා දෙනවා. මුළු දැනුම් සම්භාරයම එහි ඇතුලත්ය. අවසානයේදී, ලක්ෂ්මී සහ නාරායන, ඔවුන්ගේ 84වන උපත, සම්පූර්ණ කරමින් සිටින විට, පියා පැමිණ ඔවුන්ට රාජයෝගාව උගන්වා, ඔවුන්ට ඔවුන්ගේ රාජධානිය ලබා දුන්නා. ලක්ෂ්මී සහ නාරායනගේ පිංතූරය, අංක එකේ පිංතූරයකි. ඔවුන්ගේ පෙර භවයේදී ඔවුන් එවන් ක්‍රියා සිදු කළ බවත්, පියා ඔබට දැන් එම ක්‍රියා සිදුකරන අන්දම උගන්වන බවත් ඔබ දන්නවා. ඔහු පවසන්නේ මන්මනභව වන්න! පාරිශුද්ධ වන්න! කිසිම පාපයක් සිදු නොකරන්න, මන්ද ඔබ දැන් දිව්‍ය ලෝකයේ අධිපතියන්, පුණ්‍යාත්මයන් බවට පත් වෙමින් සිටින බැවින්. මායා, රාවණ, චක්‍රයෙන් භාගයක්ම ඔබ ලවා පාපයන් සිදු කර තිබේ. දැන් තමන්ගෙන්ම විමසන්න මා කිසියම් පාපයක් සිදු කරනවාද? මා දිගටම පුණ්‍ය කර්ම සිදු කරනවාද? මා අන්ධයින්ට සැරයටියක් වී තිබේද? පියා පවසන්නේ මන්මනභව වන්න! ඔබ මෙසේ විමසිය යුතුයි මන්මනභව කීවේ කවුද? ඒ මිනිසුන් පවසන්නේ, මෙය ක්‍රිෂ්ණා කියූ බවයි. එය පැවසුවේ උත්තරීතර පියා, උත්තරීතර ජීවාත්මය, ශිවා බව ඔබ දන්නවා. එය දිවා රාත්‍රිය මෙන් වෙනසකි. ශිවාගේ උපන් දිනය සමඟම ගීතාවේ උපන් දිනයද තිබේ. ගීතාවේ උපන් දිනය සමඟම ක්‍රිෂ්ණාගේ උපන් දිනයද තිබේ. ඔබ අනාගත රාජකුමාරයන් වන බව ඔබ දන්නවා. ඔබ යාචකයන්ගෙන් රාජ කුමාරයන් බවට පරිවර්ථනය විය යුතුයි. රාජයෝගාවේ අරමුණ සහ ඉලක්කය මෙයයි. ගීතාවේ දෙවියන්, ශ්‍රී ක්‍රිෂ්ණා නොවෙයි, නමුත් අශාරීරික ඒකායන කෙනා බව ඔබට ඔප්පු කළ හැක, එවිට දෙවියන් සැම තැනකම සිටින සංකල්පය විසි වෙයි. සියල්ලන්ටම විමුක්තිය පිරිණමන්නා සහ පාරිශුද්ධකරු වන්නේ පරමාත්ම පියා පමණක්මයි. ඔහුට මුක්ති දායකයා යැයිද කියයි. කෙසේවෙතත්, ඔහු සැම තැනකම සිටින බව, මිනිසුන් පවසයි. ඔවුන් කියන කිසිම දෙයක් ගැන වැටහීමක් ඔවුන්ට නැත! ආගම පිළිබඳව, ඔවුන්ගේ මනසට ඇතුළුවන ඕනෑම දෙයක් ඔවුන් පවසයි. ප්‍රධාන ආගම් තුනක් ඇත. දේවතා ධර්මය, චක්‍රයෙන් භාගයක් පවතී. පියා, බ්‍රහ්මණ, දේවතා සහ ක්ෂත්‍රිය යන ආගම් තුන ස්ථාපිත කරන බව ඔබ දන්නවා. ලෝකයා මෙය නොදනී. ස්වර්ණමය යුගය, වසර සිය දහස් ගණනක් දීර්ඝ බව ඔවුන් සලකති. සියලුම ආගම් වලින් ශ්‍රේෂ්ඨතම ආගම වන්නේ ආදි සනාතන දෙවි දේවතා ධර්මයයි. කෙසේවෙතත්, ඔවුන් තමන්ගේම ධර්මය අමතක කර, අධර්මිෂ්ඨ වී ඇත. ක්‍රිස්තියානුවන් ඔවුන්ගේ ආගම අත්හරින්නේ නැත. ඔවුන්ගේ ආගම ස්ථාපිත කළේ ක්‍රිස්තු තුමා බව ඔවුන් දන්නවා. ප්‍රධාන ආගම් වන්නේ ඉස්ලාම්, බෞද්ධ සහ ක්‍රිස්තියානිය. තව බොහෝ කුඩා ආගම්ද තිබේ. මෙම ව්‍යාප්තිය ආරම්භ වූයේ කොහෙන්ද කියා කිසි කෙනෙක් නොදනී. මොහොමඩ් පැමිණ දැනට ගත වී ඇත්තේ කෙටි කාලයක් පමණයි. ඉස්ලාම් අය බොහෝ පැරණිය. ක්‍රිස්තියානුවන්ද බොහෝ ප්‍රසිද්ධ වන අතර තව බොහෝ දෙනෙක්ද සිටියි. සැම කෙනෙකුටම ඔහුගේ හෝ ඇගේ ආගම තිබේ. ඔවුන්ට ඔවුන්ගේම විවිධ ආගම් සහ විවිධ නම් තිබේ, එබැවින් ඔවුන් අවුලට පත්වී සිටියි. තිබෙන්නේ ප්‍රධාන ආගමික ග්‍රන්ථ හතරක් පමණක් බව, ඔවුන් නොදනී. දේවතා ධර්මය සහ බ්‍රහ්මණ ආගම ඊට ඇතුලත්ය. බ්‍රහ්මණයින්, දේවතාවන් වන අතර ඔවුන් ඉන්පසුව ක්ෂත්‍රයන් වෙයි. කිසි කෙනෙක් මෙය නොදනී. මෙසේ ගැයෙයි බ්‍රහ්මණයන්ට නමස්කාර වේවා. පරම පියා, පරමාත්ම ජීවය පැමිණ, බ්‍රහ්මණ, දේවතා සහ ක්ෂත්‍රිය ආගම් ස්ථාපිත කළේය. මෙම ව්‍යවහාර පවතින නමුත් ඔවුන් මේ සියලුම දේවල් කියවන්නේ ගිරව් මෙනි. මෙය කටු කැලෑවකි. භාරතය, මල් උයනක්ව තිබුණු බව, මිනිසුන් විශ්වාස කරයි. කෙසේවෙතත්, එය නිර්මාණය වූයේ කවදාද, කෙසේද හෝ කවුරුන් විසින්ද කියා, කිසිවෙක් නොදනී. පරමාත්ම ජීවය යනු කවරෙක්ද කියා ඔවුන් නොදනී. එබැවින් ඔවුන් අනාථයින් වී ඇත. මෙතරම් යුද්ධ සහ සටන් තිබෙන්නේ මේ නිසාය. ඔවුන් භක්තියේ යෙදෙමින් පමණක් සතුටු වෙයි. පියා දැන් ආලෝකය ගෙන ඒමට පැමිණ ඇත. ඔහු තත්පරයකදී ඔබට ජීවන-මුක්තිය පිරිණමයි. සත්ගුරු ඔබට දැනුමේ තෙල ලබා දෙන විට, අවිද්‍යාවේ අන්ධකාරය දුරු වෙයි. අප දැන් සිටින්නේ ආලෝකයේ බව ඔබට වැටහෙයි. පියා ඔය සැම දරුවෙකුටම තෙවැනි ඇසක් දී තිබේ. දේවතාවන් තෙවැනි ඇසක් සමඟ පෙන්වා ඇති නමුත් මිනිසුන්ට එහි අරුත වැටහෙන්නේ නැත. ඇත්ත වශයෙන්ම ඔබට තෙවැනි ඇස තිබෙන නමුත් ඔවුන් තෙවැනි ඇස සමඟ දේවතාවන්ව පෙන්වා ඇත. ගීතාවේ බ්‍රහ්මණයන් ගැන සඳහනක් නොමැත. ඔවුන් ගීතාවේ කෞරවයන් සහ පාණ්ඩවයන් අතර යුද්ධයක් සහ අශ්ව රථයක් ආදිය පෙන්වා ඇත. ඔවුන්ට කිසිම දෙයක් වැටහෙන්නේ නැත. ඔබ ඔවුන්ට විස්තර කරන විට, ඔවුන් ඔබට කියන්නේ ඔබ ආගමික ග්‍රන්ථ විශ්වාස කරන්නෙත් නැහැ! ඔබ

ග්‍රන්ථ විශ්වාස නොකරන්නේ මන්ද කියා ඔවුන්ට කිව හැක. ඒ සියල්ලම භක්ති මාර්ගයේ මෙවලම් බව ඔබ දන්නා නිසා. දැනුම සහ භක්තිය සිහි කෙරෙයි. භක්තිය ආරම්භ වන්නේ රාවණාගේ රාජධානිය ආරම්භ වන විටයි. භාරතයේ ජනතාව පාපයේ මාවතට පතිත වී, ඔවුන්ගේ ධර්මයේ සහ කර්මයේ දූෂිත වෙයි, ඔවුන් තමන්ට දැන් හින්දූන් යැයි කියා ගන්නේ මේ නිසාය. ඔවුන් දැන් අපවිත්‍ර වී ඇත. ඔවුන්ව අපවිත්‍ර කළේ කවුද? රාවණ! මිනිසුන් රාවණාගේ පඹයෙක් පුළුස්සා දමයි. එය මතකයේ නොමැති කාලයක පටන් පැවත ආ බව ඔවුන් සිතයි. කෙසේවෙතත්, රාවණාගේ රාජධානිය, ස්වර්ණමය යුගයේ නොතිබිණි. ඔවුන්ට කිසිම දෙයක් නොවැටහෙයි. මායා ඔවුන්ගේ බුද්ධි මුළුමනින්ම ගල් බවට පත් කර ඇත. ඔබව ගල් වලින්, දිව්‍යමය ජීව බවට පත් කරන්නේ පියා පමණයි. ස්වර්ණමය යුගය ස්ථාපිත කළ හැක්කේ ඔබ කලි යුගයට ගිය පසු පමණයි. පියා මෙය පහදා දෙන නමුත් එය කෙනෙකුගේ බුද්ධියේ සනිටුහන් වන්නේ කලාතුරකිනි. ඔය කුමාරීන් දැන් විවාහ ගිවිස ගෙන සිටියි. ඔහු ඔබව රැජිණියන් බවට පත් කරමින් සිටියි. ඔබව පැහැර ගනු ලැබුවා, එනම්, ඔය ජීවාත්මයන්ට මෙසේ පවසන ලදි ඔබ මා සතු වූ අතර ඉන්පසුව ඔබට මා අමතක විය. ඔබ ශරීර අවධානයට පත් වී, මායා සතු විය. කෙසේවෙතත්, පැන යාම හෝ පැහැරගැනීම පිළිබඳ ප්‍රශ්නයක් නැත. නිරන්තරයෙන් මා පමණක් සිහි කරන්න. උත්සාහ දැරිය යුත්තේ සිහි කිරීමට පමණයි. බොහෝ දෙනෙක් ශරීර අවධානයට පත් වී පාප ක්‍රියා සිදු කරයි. ඇතැම් ජීව ඔහුව කොහෙත්ම සිහි නොකරන බව, පියා දන්නවා. ඔවුන් ශරීර අවධානයට පත් වී බොහෝ පාපයන් සිදු කරන අතර, ඒ නිසා පාපයේ කලස සිය ගුණයකින් පිරී යයි. අන් අයට මාවත පෙන්වනවා වෙනුවට ඔවුන්ටද මාවත අමතක වෙයි. එවිට ඔවුන් ඊටත් වඩා පහත් වෙයි. ගමනාන්තය බොහෝ ඉහළය. ඉහළට නඟින අය, දෙව්ලොව අමෘතයේ මිහිරියාවේ රස අත්විඳියි. ඇද වැටෙන අය, මුළුමනින්ම තැලී යයි. රාජධානියක් ස්ථාපිත වනවා. බලන්න කෙතරම් වෙනසක් නිර්මාණය වෙනවාද! සමහරුන් ඉගෙන ගෙන අහස උසට නඟින අතර, වෙනත් අය බිමට ඇද වැටෙයි. ඔවුන්ගේ බුද්ධි මොට නම්, ඔවුන්ට ඉගෙන ගත නොහැක. ඔවුන්ට වෙනත් අයට විස්තර කළ නොහැකි බව, ඇතැමුන් බාබාට කියයි. බාබා පවසන්නේ හොඳයි, තමන් ජීවාත්මයක් බව සලකා, ඔබගේ පරමාත්ම පියා වන මාව සිහිපත් කරන්න, එපමණයි, එවිට මා ඔබට සතුට ලබා දෙන්නම්. කෙසේවෙතත්, ඔබ මා සුළුවෙන්වත් සිහි නොකරයි. ඔබ පියාව සිහි කළේ නම්, ඔබ වෙනත් අයටද ඔහුව සිහි කර දෙයි. ඔබ පියා සිහිපත් කරන විට, ඔබගේ පාපයන් දුරු වී යයි. ඔහුව සිහිපත් නොකර ඔබට සතුටේ දේශයට යාමට බැරිය. ඔබට අශාරීරික පියාගෙන් උපත් 21කට උරුමයක් හිමි කර ගත හැක. අන් සෑම කෙනෙක්ම ලබා දෙන්නේ තාවකාලික සතුට පමණයි. කෙනෙක් ගුප්ත බලයන් මඟින් දරුවෙක් ලැබූ විට හෝ ලොතරැයියක් දිනා ගැනීමට ආශිර්වාද ලැබූ විට, එම විශ්වාසය ස්ථිර වෙයි. කෙනෙක් මිලියන දෙකකින් හෝ හතරකින් ලාභයක් ලැබූ විට, ඔහු එය ලබා දුන් කෙනාව වර්ණනා කරන නමුත්, ඒ සියල්ලම තාවකාලිකයි ඔහුට උපත් 21කට නිරෝගිකම හෝ ධනය ලබා ගත නොහැක. කෙසේවෙතත්, මනුෂ්‍යයන් කිසිම දෙයක් දන්නේ නැත, එබැවින් ඔවුන්ට වරද පැටවිය නොහැක! ඔවුන් තාවකාලික සතුටකින් නිකම්ම සතුටු වෙයි. පියා ඔය දරුවන්ට රාජයෝගාව උගන්වා, ඔබට දිව්‍ය ලෝකයේ ආධිපත්‍යය ලබා දෙයි. එය ඉතා පහසුයි! සමහරුන්ට කිසිම දෙයක් විස්තර කිරීමට නොහැක. සමහරුන්ට වැටහෙන නමුත් ඔවුන් නිවැරදි යෝගාවේ නොසිටින බැවින්, ඊතලය කිසි කෙනෙකු පසාරු නොකරයි. ශරීර අවධානයට පත් වීමෙන් එක් හෝ තව පාපයක් සිදුවෙයි. ප්‍රධානතම දේ යෝගාවයි. ඔබ ලෝකයේ අධිපතියන් වන්නේ යෝගා බලය තුළින්ය. ඔබට පෞරාණික යෝගාව ඉගැන්වූයේ ක්‍රිෂ්ණා නොවෙයි, පරමාත්ම දෙවියන්ය. සිහිපත් කිරීමේ වන්දනා ගමන ඉතා හොඳයි. ඔබ ගොස් නාටකයක් නැරඹූ විට සියලුම ජවනිකා ඔබගේ සිතට මතුවෙයි. කෙසේවෙතත්, එම කතාව වෙනත් කෙනෙකුට කීමට කාලයක් ගත වෙයි. මෙහිදීද එය එසේමයි. බීජය සහ ගස මෙම චක්‍රය ඉතා පැහැදිලි. එය තත්පරයක කරුණකි. සාම දේශය, සතුටේ දේශය සහ දුක් දේශය. කෙසේවෙතත්, ඔබට එය මතක තබා ගැනීමට හැකි විය යුතුයි. ප්‍රධානතම දේ වන්නේ පරම පියාගේ හැඳින්වීමයි. පියා පවසන්නේ මාව සිහිපත් කිරීමෙන් ඔබට සෑම දෙයක්ම දැනගන්නට ලැබෙයි. අච්චා. ශිව බාබා ඔය දරුවන්ව සිහි කරයි. බ්‍රහ්ම බාබා ඔබව සිහි කරන්නේ නැත. ඔහුගේ අගනා දරුවන් කවුරුන්ද කියා ශිව බාබා දන්නවා. ඔහු නිසැකයෙන්ම ඔහුගේ සේවයට ලැදි, අගනා දරුවන්ව සිහි කරයි. මෙම කෙනා කිසිවෙකු සිහි නොකරයි. මෙම ජීවයට මෙම උපදේශය ලැබී තිබේ නිරන්තරයෙන් මා පමණක් සිහිපත් කරන්න! අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. භාග්‍යවන්ත වීම සඳහා ඒකායන පියාට පමණක් සැබෑ සෙනෙහසක් ඇති කර ගන්න. සෙනෙහස තිබීම යනු, ඒකායන කෙනාගේ ශ්‍රීමත් සෑම පියවරකදීම අඛණ්ඩව අනුගමනය කිරීමයි.
2. අනිවාර්යෙන්ම පුණ්‍ය ක්‍රියා සිදු කරන්න. මහාම පුණ්‍ය කර්මය වන්නේ, සෑම කෙනෙකුටම පියාගේ හැඳින්වීම ලබා දීමයි. පියාව සිහි කරන්න, එමෙන්ම සෑම කෙනෙකුටම පියාව සිහිපත් කරවන්න.

**වරදානය:** ඔබ දර්ශන ලබා දෙන ප්‍රතිරූවක් වීමෙන් ඔබගේ දෘෂ්ටිය සහ ආකල්පය පරිවර්ථනය කර, ඒ අනුව ලෝකය පරිවර්ථනය කරත්වා.

ඔබගේ ආකල්පය පරිවර්ථනය කිරීමෙන් ඔබගේ දෘෂ්ටිය දිව්‍යමය කරගන්න, එවිට බොහෝ ජීවාත්ම ඔවුන්ගේ සැබෑ ස්වරූපය, ඔවුන්ගේ සැබෑ නිවහන සහ ඔවුන්ගේ රාජධානිය ඔබගේ දර්ශනය තුලින් දකිවි. ඔවුන්ට එම සැබෑ දර්ශනය ලබා දීම සඳහා, ඔබගේ ආකල්පය තුල ශරීර අවධානයේ සුළු දගකාරකමක්වත් නොතිබිය යුතුයි. ඔබගේ ආකල්පය නිවැරදි කරගෙන ඔබගේ දෘෂ්ටිය දිව්‍යමය කරගන්න එවිට මෙම ලෝකය පරිවර්ථනය වෙයි. ඔබව දකින අය, ඔබගේ ඇස් නිකම්ම ඇස් නොව, නමුත් මැජික් බඳුන් බව අත්දකියි. ඔබගේ ඇස් ඔවුන්ට දර්ශන ලබා දීමට මගක් වෙයි.

**පාඨය:** සේවය කිරීමට උනන්දුව සහ උද්යෝගය තිබීම සමගම ඔබට අසීමිත නිරාශාවේ ආකල්පයකුත් තිබිය යුතුයි. ඔබගේ සාර්ථකත්වයේ මග මෙයයි.

***** ඔම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ශ්‍රේෂ්ඨත්වයට පත් වීමට මිහිරිබව සහ නිරහංකාරකමේ ගුණධර්ම ධාරණය කරගන්න.**

මිහිරිබවේ ගුණදහම ධාරණය කරගන්නා අය මෙහිදි ශ්‍රේෂ්ඨත්වයට පත්වන අතර එහිදි තත්ත්වයකුත් ලබයි. මිහිරිබව ඇති අයව සියළු දෙනා දකින්නේ, ශ්‍රේෂ්ඨ ජීවාත්ම ලෙසයි. එබැවින් සෑම දරුවෙක් තුලම

විශේෂයෙන් මිහිරියාවේ ගුණධර්මය තිබිය යුතුයි. ඔබට “මධුසූදනා” (මිහිරි කෙනා වන ක්‍රිෂ්ණාගේ නම්බු

නාමයක්) යන නාමය කීර්තිමත් කිරීමට හැකි වන්නේ මිහිරියාව තුලින් පමණයි. තමන් තුල මිහිරිබවේ මීපැණි ඇති අයට, සිදු කරන සෑම කාර්යයකින්ම ඇත්තේ සාර්ථකත්වයම පමණයි. ඔවුන්ගේ ජීවිතයෙන්

අසාර්ථකත්වය ඉවත් වෙයි.